// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1555/9 - 2008 ජුනි 25 වැනි බදාදා - 2008.06.25

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 3/2006.

**2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත**

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 29 වන වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදය සමග කියවිය යුතු ඉහත කී පනතේ 6 වන වගන්තියේ (ආ) ඡේදය යටතේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති විසින් සාදන ලද නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2008 ක් වූ මැයි මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2008 අංක 1 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ නියෝග ලෙස සඳහන් කරනු ලබන අතර, මේ නියෝග 2008 ජුනි මස 01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2. 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ අර්ථානුකූලව වූ සෑම ආයතනයක් විසින්ම ඉහත සඳහන් පනතේ 6 වන වගන්තියේ (ආ) ඡේදය ප්‍රකාර, ගනුදෙනුකාරයෙකුගේ ඉල්ලීම මත සිදුකරන විද්‍යුත් අරමුදල් මාරුවක් සම්බන්ධයෙන් වූ මුදල් ප්‍රමාණය මුදලින් රුපියල් ලක්ෂ දහයක් (රු. 10,00,000) හෝ ඊට සමාන විදේශ මුදල් වලින් වූ මුදල් ප්‍රමාණයක් ඉක්මවන අවස්ථාවක දී මුල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කළ යුතුය.

3. 2006 මාර්තු මස 23 වන දින අංක 1437/25 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2006 අංක 1 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ නියෝග මෙයින් අවලංගු කරනු ලැබේ.

07 - 190/1

1A - G 009885- 890 (2008/06)

එල්.ඩී.බී. 3/2006.

**2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත**

6 වන වගන්තිය යටතේ නියමය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදය සමග කියවිය යුතු 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 6 වන වගන්තියේ (අ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, ඉහත සඳහන් පනතේ අර්ථානුකූල වූ සෑම ආයතනයක් විසින්ම රුපියල් ලක්ෂ දහයක (රු. 10,00,000/-) මුදලින් වූ මුදල් ප්‍රමාණයක් හෝ විදේශ මුදල් වලින් වූ ඊට සමාන මුදල් ප්‍රමාණයක් ඉක්මවන යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන්, 2008 ජුනි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කළ යුතු බවට මෙම නියමය මගින් නිශ්චය කරමි.

2006 මාර්තු මස 23 වන දින අංක 1437/25 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මෙයින් අවලංගු කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2008 ක් වූ මැයි මස 29 වැනි දින,
කොළඹ දී ය.

07-190/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.